**ශීර්ෂය 231 - ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

----------------------------------------------------------------------------------------------------------------

ශීර්ෂය 231 - ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුමහා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 ජූලි 11 දින දෙපාර්තමේන්තුවේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම්වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළහැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

--------------------------------------------------------------------------------------------------

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන්ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

-------

### 2.1 විසර්ජන ගිණුම

-----------------

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---------------------------

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 16.69 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 15.52 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 1.17 ක් හෙවත් සියයට 7.01 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 15.89 | 14.96 | 0.93 | 5.85 |
| මූලධන | 0.80 | 0.56 | 0.24 | 30.00 |
| **එකතුව** | **16.69** | **15.52** | **1.17** | **7.01** |

## 2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

### පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 23101 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 1.20 | 1.12 | 0.30 | 0.91 | 2.50 | 1.84 |

## 2.3 විගණන නිරීක්ෂණය

ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

## 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන තුනක් පවත්වා නොතිබුණු අතර, තවත් ලේඛනයක් විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|---|
| (අ) | විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 454(2) | පවත්වා නොතිබුණි. |
| (ආ) | රාජකාරී දුරකථන ලේඛනය | මුදල් රෙගුලාසි 845(1) | පවත්වා නොතිබුණි. |
| (ඇ) | ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891(1) | පවත්වා නොතිබුණි. |
| (ඈ) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | යාවත්කාලීන කර පවත්වා නොතිබුණි. |

**3.2 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

**3.2.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්ම, 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව අදාළ සියළු තොරතුරු ඇතුළත් කර හා නිවැරදි ආකෘතියෙන් පිළියෙල කර නොතිබුණි.

**3.2.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, එම වාර්තාව 2016 ජූලි 10 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**3.3 වත්කම් කළමනාකරණය**

**වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2016 වර්ෂයේ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාව විගණනයට ඉදිරිපත් කර තිබුණි. එම චක්‍රලේඛයේ 3.1.4 හා 3.1.5 ඡේදවල දක්වා ඇති විධිවිධාන ප්‍රකාරව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයේදී හඳුනාගත් ඌනතා, අතිරික්තතා හා අපහරණය කළ යුතු වත්කම් සම්බන්ධයෙන් 2017 ජූලි 11 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

**3.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

2015 දෙසැම්බර් 29 දිනැති අංක 07/2015 දරන චක්‍රලේඛයේ 02 ඡේදය ප්‍රකාරව ඉන්ධන වියදම් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනවලින් සියයට 15ක අනිවාර්ය ඉතිරි කිරීමක් කළ යුතු වුවද, සියයට 11 ක් පමණක් ඉතිරි කර තිබුණි.

**3.5 කාර්යසාධනය**

2016 ජනවාරි 01 දින වන විට දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබුණු නමුත් විසඳීමක් ලබා නොදුන් ඉල්ලුම්පත් සංඛ්‍යාව 834 ක් වී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී ඉල්ලුම්පත් 394 ක් ලැබී තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේදී ඉල්ලුම්පත් 1,228 ක කටයුතු ඉටු කිරීමට තිබුණි. නමුත් සමාලෝචිත වර්ෂයේදී ඉල්ලුම්පත් 403 ක කටයුතු නිම කර තිබුණි. ඒ අනුව 2016 දෙසැම්බර් 31 දින වන විට අයදුම්පත් 825 ක කටයුතු ඉටු කළ යුතුව තිබුණි. එම අයදුම්පත් දෙපාර්තමේන්තුව වෙත ලැබී වර්ෂ 01 ක සිට වර්ෂ 10 ක් දක්වා කාල පරාසයක සිට පැවත එමින් තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ඒවා විසඳා නොතිබුණි. දෙපාර්තමේන්තුව වෙත ලැබී තිබුණු විසඳා නොතිබුණු ඉල්ලුම්පත් පිළිබඳ කාල විශ්ලේෂණයක් පහත දැක්වේ.

| **දෙපාර්තමේන්තුව වෙත ලැබී 2016 දෙසැම්බර් 31 දිනට නොවිසදා රඳවා ගෙන තිබුණු කාලය** | **ඉල්ලුම්පත් සංඛ්‍යාව** |
|---|---|
| වර්ෂ 10 කට වඩා පැරණි ඉල්ලුම්පත් | 32 |
| වර්ෂ 06 ත් වර්ෂ 10 ත් අතර කාලයක් ගතවී තිබුණු ඉල්ලුම්පත් | 45 |
| වර්ෂ 03 ත් වර්ෂ 06 ත් අතර කාලයක් ගතවී තිබුණු ඉල්ලුම්පත් | 143 |
| වර්ෂ 01 ත් වර්ෂ 03 ත් අතර කාලයක් ගතවී තිබුණු ඉල්ලුම්පත් | 305 |
| වර්ෂයකට වඩා අඩු කාලයක් ගතවී තිබුණු ඉල්ලුම්පත් | 300 |
| **එකතුව** | **825** |

## 3.6 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | **සේවක වර්ගය** | **අනුමත සේවක සංඛ්‍යාව** | **තථ්‍ය සේවක සංඛ්‍යාව** | **පුරප්පාඩු සංඛ්‍යාව** |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 01 | - | 01 |
| (ii) | ද්විතියික මට්ටම | 14 | 08 | 06 |
| (iii) | ප්‍රාථමික මට්ටම | 06 | 05 | 01 |
| | **එකතුව** | **21** | **13** | **08** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2013 මැයි මාසයේ සිට පුරප්පාඩුව පවතින ලේකම් තනතුර සඳහා වරින් වර වැඩ බැලීමේ පත්වීම් සිදුකර තිබුණු නමුත් 2017 ජුනි 15 දින වන විටත් එම තනතුර සඳහා නිත්‍ය නිලධාරියෙකු පත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ලඝු ලේඛන නිලධාරීන් තිදෙනෙකුගේ පුරප්පාඩු පැවති බැවින් නියමිත කාලයට නඩු වාර්තා යතුරු ලේඛනය කිරීමට නොහැකි වී තිබුණි.

(ඇ) දෙපාර්තමේන්තුව සතු වාහන දෙකක් පැවතියද, එක් රියදුරෙකු පමණක් අනුයුක්තව සිටීමෙන් ආයතනයේ කටයුතුවලට බාධා වී තිබුණි.